**ව්‍යාපාර අධ්‍යයනය II – 13 ශ්‍රේණිය**

**දෙවන වාර පරීක්ෂණය - 2019**

**කාලය පැය 3**

අමතර කියවීම් කාලය මිනිත්තු 10

- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

01) (i) වර්තමානයේ පවතින්නේ "විද්‍යුත් වාණිජ්‍යය" හා "විද්‍යුත් ව්‍යාපාර" පදනම් වූ යුගයකි.

(අ) ඉරි ඇඳි පද දෙක කෙටියෙන් හඳුන්වන්න. (ල:2)

(ආ) විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිත වීමට හේතු හතරක් ලියන්න. (ල:2)

(ii) තිරසර සංවර්ධනය යථාර්ථයක් බවට පත්කර ගැනීම රජයකට පමණක් කළ නොහැක්කකි. ඒ සඳහා ව්‍යාපාරිකයන් හා පාරිභෝගිකයන් මෙන්ම සමස්ත ආර්ථික ප්‍රජාවම ක්‍රියාකාරී දායක විය යුතුය.

(අ) ව්‍යාපාර ආයතනයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ල:2)

(ආ) පාරිභෝගිකයාට තිරසර සංවර්ධනයට දායක විය හැකි ආකාර හතරක් යෝජනා කරන්න. (ල:2)

(iii) (අ) 'රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවත්වාගැනීම වැදගත් වේ.' පැහැදිලි කරන්න. (ල:2)

(ආ) පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය වේ. පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත්වන වාසි දෙක බැගින් ලියන්න. (ල:2)

(iv) "නෛතික පුද්ගලභාවය" සහ "වගකීම" යන සංකල්ප විවිධ ව්‍යාපාර සංවිධාන සඳහා විවිධාකාරයෙන් බලපායි.

(අ) නෛතික පුද්ගලභාවය යන සංකල්පය ව්‍යාපාරයක හිමිකරුවන්ට වාසිදායක වන ආකාරය පැහැදිලි කරන්න. (ල:2)

(ආ) වගකීම අසීමිත වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල:2)

(v) සීමාසහිත ජයෝදා හවුසස් (පෞද්) සමාගම නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයකි. මෙම ආයතනය තවත් පුළුල් කරමින් සීමිත පොදු සමාගමක් බවට පත්කිරීමට යෝජනාවක් ඉදිරිපත් වී ඇත. අධ්‍යක්ෂක මණ්ඩලයේ කිහිපදෙනෙකු එම යෝජනාවේ ප්‍රතිලාභ පෙන්වා දෙමින් යෝජනාවට පක්ෂව කරුණු දැක්වූ අතර තවත් කිහිපදෙනෙකු යම් යම් සීමාවක් පෙන්වා දෙමින් යෝජනාවට විපක්ෂව කරුණු දැක්විය.

(අ) ඉහත සිද්ධියේ යෝජනාවට පක්ෂ අධ්‍යක්ෂවරයකු ලෙස ඔබ ඉදිරිපත් කරන ප්‍රතිලාභ මොනවාද? (ල:2)

(ආ) යෝජනාවට විපක්ෂ අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔබ ඉදිරිපත් කරන සීමා මොනවාද? (ල:2)

02) (i) "රටකට ව්‍යාපාරිකයන්ට වඩා අවශ්‍ය වන්නේ ව්‍යවසායකයන්ය." මෙම කියමන සනාථ කරමින් ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ල:4)

(ii) තම අරමුණු ඉටු වන තෙක් තමන් කරන කාර්යය දැඩි උනන්දුවකින් සිදු කරන සහශ්‍රා වෙනත් අයගේ අදහස් මත යැපෙන්නෙකු නොවී තමන්ගේ අදහස් හා හැකියා හැකි තරම් දුරට ක්‍රියාත්මක කරමින් තම ව්‍යාපාරයට නායකත්වය දෙයි.

(අ) සහශ්‍රාගේ චරිතය තුළින් මතුවන සිද්ධිය තුළ ඇතුළත් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල:1)

(ආ) සිද්ධිය තුළ ඇතුලත් සහශ්‍රා සතු ව්‍යවසායකත්ව කුසලතාවක් නම් කරන්න. (ල:1)

(ඉ) සහශ්‍රාට තම ගතිලක්ෂණ හා කුසලතා වර්ධනය කරගත හැකි ආකාර දෙකක් නම් කරන්න. (ල:2)

(iii) (අ) රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධාකාරයෙන් දායකත්වය ලබා දෙයි. මෙම කියමන සනාථ කරමින් නිදසුන් දක්වන්න. (ල:2)

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වාගෙන යාමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න. (ල:2)

(iv) "මුදලින් කෙරෙන එකම කාර්යය වන්නේ වටිනාකම මැනීමේ මිනුමක් ලෙස කටයුතු කිරීමයි" මෙම කියමන හා ඔබ එකඟ වන්නේ ද? හේතු පැහැදිලි කරන්න.

(v) (අ) ධාරක චෙක්පතක් හා විධාන චෙක්පතක් අතර වෙනස්කම් දෙකක් ලියන්න. (ල:1)

(ආ) චෙක්පතක් පිටසන් කිරීම යනු කුමක්ද? (ල:1)

(ඉ) චෙක්පතක් පිටසන් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද? (ල:1)

(ඊ) ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකුවට අත්වන වාසි දෙකක් ලියන්න. (ල:1)

03) (i) රක්ෂණය හා සම්බන්ධ පහත සංකල්ප කෙටියෙන් හඳුන්වන්න.

(අ) අවදානම හා උපද්‍රවය

(ආ) අලාභ හා හානි

(ඉ) රක්ෂණ ගිවිසුම හා රක්ෂණ ඔප්පුව

(ඊ) ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය (ල:4)

(ii) සරෝජනි ලිපිකාරිනියකි. ස්වාමියා මිය ගොස් ඇති අතර වයස අවුරුදු 10 ට අඩු දරුවන් දෙදෙනෙකු සිටී. ස්වාමියාගෙන් උරුම වූ නිවස හා දේපොළ ද ඇත.

(අ) සරෝජනීට මුහුණපෑමට සිදුවිය හැකි අවදානම් දෙකක් හා එම අවදානම් ආවරණය සඳහා ඇයට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග දෙක බැගින් ලියන්න.

පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයක වගුවක් යොදා ගන්න. (ල:3)

| අවදානම | ලබා ගත හැකි රක්ෂණ ඔප්පු |
|---|---|
| 1. | A.<br>B. |
| 2. | C.<br>D. |

(ආ) නැව් බඩු රක්ෂණය යටතේ ලබා ගත හැකි ඔප්පු වර්ග දෙකක් නම් කරන්න. (ල:1)

(iii) පහත දැක්වෙන්නේ ආයතනයක් පුවත්පතක පළ කරන ලද දැන්වීමකි.

| |
|---|
| ගිණුම් ලිපිකරුවන් බඳවා ගැනේ.<br>ආකර්ශනීය වැටුප්<br>ඔබගේ අයදුම්පත දින 07 ක් ඇතුලත යොමු කරන්න.<br>මල්වත්ත පාර<br>කොළඹ |

(අ) ඉහත දැන්වීමේ උල්ලංඝනය වී ඇති සන්නිවේදන මූලිකාංග දෙකක් නම් කරන්න. (ල:2)

(ආ) මෙම දැන්වීම මගින් සිදුකෙරෙන සන්නිවේදනය සඵලදායි නොවීමට බලපාන ගුණාංග දෙකක් නම් කරන්න. (ල:1)

(ඉ) මෙම පණිවුඩය සකස් කිරීමේ දී සැලකිලිමත් වී නොමැති කරුණු 02 ක් ලියන්න. (ල:1)

(iv) (අ) ලිඛිත සන්නිවේදන මාධ්‍යයට සාපේක්ෂව වාචික සන්නිවේදන මාධ්‍යයේ දැකිය හැකි වාසි හතරක් ලියන්න. (ල:2)

(ආ) සංඥා හා සංකේත මාධ්‍යයේ වාසි හා අවාසි දෙක බැගින් ලියන්න. (ල:2)

(v) කලක් විදේශගතව සිට ශ්‍රී ලංකාවට පැමිණි නියෝමාල් ඔහුගේ මිතුරකු වූ දිනුක සමග කල කතාබහක කොටසක් පහත දැක්වේ.

"මම ශ්‍රී ලංකාවට ආවේ අවුරුදු ගාණකට පස්සේ. මට හරි සංතෝෂයි අලුත් වරායවල්, ගුවන් තොටුපළවල් ඉදිවෙලා, අධිවේගී මාර්ග හැදිලා. දැන් ශ්‍රී ලංකාවේ ප්‍රවාහනය සංවර්ධනය වෙලා."

(අ) ඔබට නියෝමාල්ගේ ''ප්‍රවාහනය සංවර්ධනය වෙලා'' යන අදහස සමග එකග විය හැකිද? හේතු පැහැදිලි කරන්න. (ල:3)

(ආ) ආර්ථික හා සමාජ සංවර්ධනයේ සහ ගෝලීයකරණයේ ප්‍රධානම උපාංගය ප්‍රවාහනයයි. එම නිසා ප්‍රවාහනය විවිධ පාර්ශව වලට විවිධ ආකාරයෙන් වැදගත් වේ. නමුත් ප්‍රවාහනයේ අහිතකර බලපෑම් ද නැතුවා නොවේ. එවැනි ප්‍රවාහනයේ අහිතකර බලපෑම් දෙකක් ලියන්න. (ල:1)

04) (i) ජයවික්‍රම මහතා ඇපල් සහ මිදි ආනයනය කිරීමේ හා බෙදා හැරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. ඔහුගේ ව්‍යාපාරික කටයුතු පුළුල් වීමත් සමග ආනයනික ඇපල් හා මිදි රැස්කර තබා ගැනීම සඳහා ගබඩාවක් ස්ථාපනය කිරීමට අවශ්‍යව ඇත. සුදුසු ස්ථානයක ගබඩාවක් ස්ථානගත කිරීමේ දී ජයවික්‍රම මහතා විසින් සලකා බැලිය යුතු කරුණු හතරක් හේතු සහිතව පැහැදිලි කරන්න. (ල:4)

(ii) (අ) විධිමත්ව සැලසුම්කළ ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) පද්ධතියකින් ව්‍යාපාරිකයෙකුට ලබා ගත හැකි ප්‍රයෝජන හතරක් ලියන්න. (ල:2)

(ආ) ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක මූලික ක්‍රියාවලි දෙක නම් කරන්න. (ල:2)

(iii) වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි මෙන්ම අවාසි ද පවතී.

(අ) අතරමැදියන් යනු කවුරුන්දැයි නිදසුන් සහිතව කෙටියෙන් හඳුන්වන්න. (ල:2)

(ආ) වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න. (ල:2)

(iv) වෙළෙඳසැල් රහිත විද්‍යුත් සිල්ලර වෙළෙඳාම (Non-Store Retailing) වර්තමානයේ සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතාවකි.

(අ) වෙළෙඳසැල් රහිත විද්‍යුත් සිල්ලර වෙළෙඳාම යනු කුමක්ද?

(ආ) මෙම ක්‍රමය පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වීමට හේතු දෙකක් ලියන්න. (ල:2)

(v) විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා හතරක් ලියන්න.

## II කොටස

05) (i) අතීතයට වඩා වර්තමානයේ කළමනාකරණයේ අවශ්‍යතාව දැනේ. අනාගතයේ දී ඊටත් වඩා දැඩිව දැනෙනු ඇත.

(අ) කළමනාකරණයේ අවශ්‍යතාව දැඩිව දැනීමට හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:2)

(ආ) ආයතනයකට කළමනාකරණයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. (ල:2)

(ii) කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) පරමාර්ථ (ආ) අරමුණු

(ඉ) ප්‍රතිපත්ති (ඊ) උපායමාර්ග (ල:4)

(iii)(අ) සංවිධාන සටහන හා පාලන අවකාශය අතර සම්බන්ධතාවක් පවතී. එම සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ආ) සංවිධානකරණ ක්‍රියාවලියේ දී මුල්ම පියවර වන්නේ කාර්ය හඳුනා ගැනීමයි. කළ යුතු කාර්යය නිවැරදිව හඳුනාගත් පසු කල යුතු ඉදිරි පියවර නම් කරන්න.

(iv) පහත දැක්වෙන්නේ තමන් සේවය කරන ආයතනයේ නායකයා පිළිබඳව සේවකයින් කිහිපදෙනෙකු දැක්වූ අදහස් වේ.

A. ආයතනයේ සේවකයා – අපේ බොස් අපේ වැඩ වලට බලපෑම් කරන්නේ නැහැ. හැමෝටම තමන්ගේ කාර්යය කරන්න ඉහළ නිදහසක් දීලා තියෙනවා. අපි සතුටින් වැඩ කරනවා.

B. ආයතනයේ සේවකයා – අපේ සර්ත් අපේ අදහස් වලට ගරු කරනවා. හැමෝම එක්ක හොඳ බැඳීමක් තියෙනවා. තීරණ ගන්න අපිවත් සම්බන්ධ කර ගන්න නිසා හරිම සතුටුයි.

C. ආයතනයේ සේවකයා – ඒකට අපේ බොස් අපේ අදහස්වලට කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. විධාන දීම තමයි කරන්නේ. බලකිරීමෙන් තමයි වැඩ කරවා ගන්නේ. අපිත් ඉතිං බයට වැඩ කරනවා.

(අ) නායකයා කටයුතු කරන ආකාරය අනුව ඉහත ආයතනවල නායකත්ව ශෛලීන් නම් කරන්න. (ල:1½)

(ආ) අවස්ථානුකූල නායකත්වය යනු කුමක්ද? (ල:1)

(ඉ) සාර්ථක නායකයකු තුළ තිබිය යුතු නායකත්ව ගුණාංග තුනක් ලියන්න. (ල:1 ½)

(v) (අ) ව්‍යාපාරයක 'මෙහෙයුම් කටයුතු' යනු මොනවාද? (ල:1)

(ආ) මෙහෙයුම් කළමනාකරණය යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ල:1)

(ඉ) ආයතනයකට මෙහෙයුම් කළමනාකරණය වැදගත් වීමට හේතු දෙකක් ලියන්න. (ල:2)

06) නිෂ්පාදන වල ස්වභාවය අනුව විවිධ ආයතන විවිධ නිෂ්පාදන ක්‍රම භාවිතා කරයි.

(i) (අ) කාර්ය නිෂ්පාදනයේ හිතකර හා අහිතකර ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ල:2)

(ආ) කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා කම්හල් පිරියත සැලසුම් කිරීම අවශ්‍ය වේ. ව්‍යාපාරයකට කම්හල් පිරියත සැලැස්මක අවශ්‍යතාව දැක්වීමට කරුණු හතරක් ලියන්න. (ල:2)

(ii) "Quality -2019" වාර්ෂික වෙළෙඳ ප්‍රදර්ශනයේ දී විවිධ ආයතනවල කළමනාකරුවන් තම ආයතනයේ නිෂ්පාදිතවල ගුණාත්වය ආරක්ෂා කර ගැනීමට භාවිතා කරන ක්‍රම පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කල ආකාර කිහිපයක් පහත දැක්වේ.

X ආයතනය – අපේ කිසිම නිෂ්පාදිතයක කිසිම දෝෂයක් නැති බව අපට 100% විශ්වාසයි. ඒකට හේතුව යම් වරදක් වැළැක්විය නොහැකියි පිළිගැනීමට වඩා ප්‍රථම වතාවටම නිවැරදිව කිරීමට අපි වගබලා ගන්න නිසයි.

Y ආයතනය – අපේ ආයතනයේ සේවකයෝ සෑම මාසයකම එක දිනක දී තම තමන්ගේ අංශවලදී තම තමන් මුහුණ දෙන ගැටළු සාකච්ඡා කරනවා. ගොඩක් ගැටළු ඒ ඒ අංශ වලදීම විසඳා ගන්නවා.

Z ආයතනය – අපේ නිෂ්පාදිතවල ගුණාත්වය ආරක්ෂා කර ගන්න නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක්ම විධිමත් පරීක්ෂාවකට ලක් වෙනවා. අපේ අරමුණ වෙන්නේ ගැටළු සෙවීමට වඩා ගැටළු සිදුවීම වැළැක්වීමයි.

(අ) ඉහත එක් එක් ආයතනය තත්ත්ව පාලනය සඳහා භාවිතා කරන ශිල්ප ක්‍රමය නම් කරන්න. (ල:3)

(ආ) ආයතනයකට ගුණාත්ව පාලනය වැදගත්වීමට හේතු දෙකක් ලියන්න. (ල:1)

(iii) පහත දැක්වෙන්නේ සීමාසහිත රසරැස කුළුබඩු නිෂ්පාදන සමාගමේ පසුගිය වසරේ දත්ත කිහිපයකි.

අමුද්‍රව්‍ය ඒකක 2000

ශ්‍රම පැය ගණන 1000

නිමැවුම 12000

(අ) පහත දෑ ගණනය කරන්න.

1. ද්‍රව්‍ය ඵලදායිතාව
2. ශ්‍රම ඵලදායිතාව
3. පූර්ණ ඵලදායිතාව (ල:1 ½)

(ආ) ඉහත එක් එක් ඵලදායිතාව වර්ධනය කරගත හැකි ආකාර එක බැගින් ලියන්න. (ල:1 ½)

(ඉ) ඵලදායිතාව වර්ධනය කරගත හැකි නව තාක්ෂණික ශිල්ප ක්‍රම දෙකක් ලියන්න. (ල:1)

(iv) නූතන හුවමාරු ආර්ථිකය යටතේ භාවිත වන මූලික වෙළෙඳපොළ කොටස් නම් කරන්න.

(v) අලෙවිකරණය ව්‍යාපාරිකයාට පාරිභෝගිකයාට මෙන්ම සමස්ථ ආර්ථිකයට ද වැදගත් වේ.

(අ) ව්‍යාපාරිකයාට අලෙවිකරණය වැදගත් වන්නේ කෙසේද? (ල:2)

(ආ) රටක ආර්ථිකයට අලෙවිකරණය වැදගත් වන්නේ කෙසේද? (ල:2)

07) (i) (අ) වෙළෙඳ පොළ ඛණ්ඩනය යනු කුමක්ද? (ල:2)

(ආ) ව්‍යාපාරයකට වෙළෙඳ පොළ ඛණ්ඩනයෙන් අත්කර ගත හැකි ප්‍රයෝජන හතරක් ලියන්න. (ල:2)

(ii) ඔබ නවීන මෝස්තරයේ පාවහන් නිෂ්පාදන ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කර ඇතැයි සිතන්න. ඔබගේ පාවහන් පාරිභෝගිකයාට විවිධ වටිනාකම් ලැබෙන ආකාරයට නිෂ්පාදිත මට්ටම සංවර්ධනය කරමින් ඉදිරිපත් කළ හැකි ආකාර නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න.

(iv) මූල්‍ය කලමනාකරණයේ දී මූල්‍ය කළමනාකරුවන්ගේ මූලික අරමුණ ව්‍යාපාරයේ හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීමයි. අගය (ධනය) උපරිම කිරීම යනු කුමක්දැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(v) සීමාසහිත චාමී පුද්ගලික සමාගම සඳහා අවශ්‍යව ඇති රුපියල් ලක්ෂ දහයක මුදලක් සම්පාදනය කර ගැනීම සම්බන්ධව සාකච්ඡා කිරීමට පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී එක් කළමනාකරුවකුගේ යෝජනාව වූයේ බැංකු ණයක් මගින් මෙම අරමුදල සපයා ගැනීමයි. එමෙන්ම තවත් කළමනාකරුවකුගේ යෝජනාව වූයේ මූල්‍ය දුෂ්කරතා පවතින බැවින් ව්‍යාපාරයේ අතිරික්ත වත්කම් විකිණීමෙන් මෙම අරමුදල සපයා ගැනීමයි.

(අ) බැංකු ණයක් ලබා ගැනීමේ වාසි හා අවාසි මොනවාද? (ල:2)

(ආ) අතිරික්ත වත්කම් විකිණීමේ වාසි හා අවාසි මොනවාද? (ල:2)

(ඉ) ඔබ මෙම ආයතනයේ මූල්‍ය කළමනාකරු නම් ඉහත මූල්‍ය සම්පාදන මාර්ග දෙකෙන් කුමන මූල්‍ය මාර්ගය තෝරා ගන්නේද? ඊට හේතු මොනවාද? (ල:2)

(vi) (අ) මූල්‍ය පද්ධතිය යනු කුමක්ද? (ල:2)

(ආ) මූල්‍ය පද්ධතියක සංයුතිය ලියා දක්වන්න. (ල:2)

08) (i) මූල්‍ය උපකරණ වල කල්පිරීමේ කාලය පදනම් කරගෙන මූල්‍ය වෙළෙඳපොල වර්ග කරන ආකාරය ගැලීම් සටහනකින් දක්වන්න.

(ii) (අ) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කොළඹ කොටස් හුවමාරුව වැදගත් වීමට හේතු හතරක් ලියන්න. (ල:2)

(ආ) සීමිත පොදු සමාගමක් කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත කිරීමේ දී භාවිතා කරන පුවරු දෙක නම් කරන්න. (ල:2)

(iii) (අ) කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් හතරක් නම් කරන්න. (ල:2)

(ආ) ඉන් ඕනෑම සුරැකුම්පත් දෙකක ආයෝජනයෙන් ලබාගත හැකි සෘජු ප්‍රතිලාභ නම් කරන්න. (ල:1)

(ඉ) කොටස් වෙළෙඳපොලේ සුරැකුම්පත් වල ආයෝජනයෙන් ලබා ගත හැකි වක්‍ර ප්‍රතිලාභ දෙකක් ලියන්න. (ල:1)

(iv) "ව්‍යාපාරයේ අනෙක් සියලු සම්පත් වලට වඩා වැදගත් ම එමෙන් ම වටිනාම සම්පත මානව සම්පතයි" මෙම කියමන සනාථ කරන්න. (ල:4)

(v) (අ) රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල:2)

(ආ) රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය අතර වෙනස්කම් සසඳන්න. (ල:2)